# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
## Chief Secretary's Office – North Western Province
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල மாகாண சபை அலுவலகத் தொகுதி, குருணாகல் Provincial Council Office Complex, Kurunegala

ආයතන හා පරිපාලන අංශය தாபனமும் நிருவாக பிரிவு Establishment and Administration Division


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No: NWP/CS/AD/5/7/10/2-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No: | දිනය / திகதி / Date: 2022.06. 17 |

වයඹ පළාත් ආණ්ඩුකාරවර ලේකම්,

වයඹ පළාත් සභා ලේකම්,

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,

සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**<u>වයඹ පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2022</u>**

උක්ත කරුණ සම්බන්ධ මගේ සමාංක හා 2022.03.22 දිනැති ලිපිය මඟින් දැනුම් දෙන ලද ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව, වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් ගන්නා ලද තීරණය අනුව සකස් කරන ලද සමස්ථ ස්ථාන මාරුවීම් ලැයිස්තුව මෙහි ඇමුණුම් 01 හි දැක්වෙන අතර ඔබ ආයතනයේ සේවය කරන කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන්ට එම ස්ථාන මාරුවීම් නියෝග දැන ගැනීමට සලස්වා 2022.07.01 දින නව සේවා ස්ථානයේ වැඩ භාරගන්නා ලෙස ඔවුන්ට දැනුම් දෙන මෙන් කාරුණිකව දන්වමි.

02. එසේම මගේ සමාංක හා 2021.02.19 දිනැති 2021 වාර්ෂික ස්ථාන මාරු දැනුම්දීමේ ලිපියෙන් වසරකින් දීර්ඝ කරන ලද වාර්ෂික ස්ථාන මාරු නියෝගය ද මෙම දිනට ක්‍රියාත්මක කළ යුතුය.

03. තවද වයඹ පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන් විසින් මා වෙත යොමු කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසුව මෙම ස්ථාන මාරුවීම් නියෝග ලබා දී ඇති බැවින් නැවත අභියාචනා භාර නොගන්නා බවද අදාළ නිලධාරීන්ට දැන්විය යුතුය.

04. එමෙන්ම, සියළුම ස්ථාන මාරුවීම් නියෝග ලබා ඇති කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන්ගේ අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වනසේ මුදා හැරීමට කටයුතු කළ යුතු බව ද වැඩිදුරටත් දන්වමි.

පී.බී.එම්. සිරිසේන,
ප්‍රධාන ලේකම් ,
වයඹ පළාත .

D:\AD 05\වාර්ෂික ස්ථාන මාරු 2021\අවසන් ලිපිය 2022.06.09.docx